**උපර්මාධිකරණ සංකීර්ණ කළමණාකරන මණ්ඩලය.**

1. **මූල්‍ය ප්‍රකාශන**

1:1 **තත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට උපර්මාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

1.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**

නිරීක්ෂණය වු කරුණු පහත දැක්වේ.

(අ) උපර්මාධිකරණ සංකිර්ණ ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) මණ්ඩලය සතු ගොඩනැගිල්ලෙහි ඉඩකඩ ආයතන කිහිපයක් පාවිච්චි කර තිබූ අතර, ඒ සඳහා මණ්ඩලය විසින් එම ආයතන වලින් ගොඩනැගිලි කුලී අයකර ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මෝටර් රථ නඩත්තු වියදම් රු.187,500 ප්‍රාග්ධන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

1.2.2 **ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට ණයගැතියන්ගේ වටිනාකම රු. 4,338,535 ක් වන අතර, ඉන් එකතුව රු. 1,303,019 ක් වසර 1-5 ක් අතර කාලයක සිටද, එකතුව රු. 44,729 ක් වසර 5 කට අධික කාලයක සිටද, අය නොවී පැවති අතර අඩමාණ ණය සඳහා කිසිදු වෙන් කිරීමක් ද සිදු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට ණය හිමියන්ගේ වටිනාකම රු. 390,434 ක් වන අතර, ඉන් එකතුව රු. 158,923 ක් වසර 1-5 ත් අතර කාලයක සිටද එකතුව රු. 231,509 ක් වසර 5 කට වැඩි කාලයක සිටද නිරවුල් කර නොතිබුණ.

### 1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

පහත දැක්වෙන ගිණුම් විෂයන් ඉදිරියෙන් දක්වා ඇති විගණන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| විෂයය | වටිනාකම (රු) | ඉදිරිපත් නොකල ලිඛිත සාක්ෂි |
|---|---|---|
| (අ) ගොඩනැගිලි | 2,421,470,587 | අයිතිය සනාථ කරන ලිපි ලේඛණ |
| (ආ) ඉඩම් | - | තක්සේරු කරන ලද වටිනාකම් හා ඔප්පු |

### 1.2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථාවන් නිරීක්ෂණය විය.

| නීතිරීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) මු.රෙ.751 | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛණයක් විධිමත් ලෙස පවත්වා නොතිබුණි. |
| (ඇ) 2004 පෙබරවාරි 24 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය 2004/01 | අවසන් ගිණුමේ කෙටුම්පතක් හා වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක PED 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| I. 5:2:5 වගන්තිය | පාලක මණ්ඩලය අනුමත කල අයවැය ලේඛනය සමාලෝචිත වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර අධිකරණ අමාත්‍යාංශයට රාජ්‍ය ව්‍යාපාර,දෙපාර්තමේන්තවට හා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. |
| II. 7:4:4 වගන්තිය | සේවක ඵලදායිතාවය ඉහල නැංවීම සඳහා විධිමත් ආකාරයට සේවක පුහුණු කිරීමේ කමිටුවක් පිහිටුවා පුහුණු |

| | | |
|---|---|---|
| | | වැඩසටහන් සඳහා සේවකයන් තෝරා ගෙන නොතිබුණි. |
| III. | 2002 නොවැම්බර් 28 දින හා 1A1/2002/02 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා ඒ සම්බන්ධව උපාංග වෙනුවෙන් වෙනම පරිගණක ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කළමනාකරණ මණ්ඩලයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 2,483,781 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. 894,478 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 1,589,304 ක වර්ධනයක් ඇතිවීම සඳහා වෙනත් ක්‍රියාකාරී වියදම රු. 2,731,127 කින් ද, පෙර වර්ෂ ගැලපීම් රු.1,211,256 ක වැඩි වීමද හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වූ ඇස්තමේන්තු ගත අයවැය ලේඛනය අනුව ප්‍රාග්ධන වියදම රු. මිලියන 50 කි. එකී වියදම් චීන රජය මගින් රුපියල් මිලියන 45 ක් හා ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන මගින් රුපයල් මිලියන 05 ක් ද ලෙස ලබා ගැනීමට සැලසුම් කර තිබුණි. 2011 වර්ෂය තුළදී ශ්‍රී ලංකා රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන ලෙස රුපියල් මිලියන 2.32 ක් ලැබී තිබූ අතර, එයින් රුපියල් මිලියන 1.507 ක් වියදම් කර තිබුණි. චීන රජයෙන් ලබා ගැනීමට අපේක්ෂිත වූ රුපියල් මිලියන 45 ක මුදල ලබා ගැනීමට කලමනාකරණය අපොහොසත් වීම හේතුවෙන් එම ප්‍රතිපාදන තුළින් අපේක්ෂිත කාර්භාරය වූ අධිකරණ ගොඩනැගිලි නඩත්තු අළුත්වැඩියාවෙහි කිසිඳු කාර්යයක් වර්ෂය තුළදී ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යයන් 29 ක් ඉටු කිරීමට අපේක්ෂා කළද වර්ෂය තුළදී ඉටු කර ඇත්තේ කාර්යයන් 09 ක් පමණි.

### 3.2 ආර්ථික නොවූ ගනුදෙනු

සමාලෝචිත වර්ෂය තුළදි පුරප්පාඩුව පැවති තනතුරු 06 ක් පිරවීම සඳහා විධිමත් සැලැස්මක් නොමැතිව අවස්ථා කිහිපයකදී පුවත්පත් දැන්වීම් පල කිරීම හා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම හේතුවෙන් රු. 532,822 ක් වැය කර තිබුණද, උක්ත පුරප්පාඩු වලින් තනතුරු 02 ක් සම්පූර්ණ කර තිබුණි.

### 3.3 මතභේදයට තුඩු දෙන ගණුදෙනු

**මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ විදුලි වියදම රු.28,920,894 ක් වූ අතර එය මුළු උපයෝගිතා වියදමින් 87% කි. විදුලි වියදම පිළිබඳ පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණ විය.**

(i) **මණ්ඩලය විසින් උපරිමාධිකරණ සංකීර්ණයේ ශාලා/කාමර වෙනත් ආයතන වල භාවිතය සඳහා ලබා දී තිබුණද, එම ආයතන වලින් විදුලිය පරිභෝජනය සඳහා ගාස්තු අය කර නොතිබූ හෙයින් එය වාර්ෂික විදුලි වියදම වැඩිවීමට හේතු වී තිබුණි.**

(ii) **විදුලි පරිභෝජනය අවම කිරීම හා කාලීන අවශ්‍යතාවයන් කෙරෙහි අවධානය කර තිරසාර වැඩසටහනකට මණ්ඩලය යොමු නොවීම.**

## 04. **පද්ධති හා පාලන**

---------------------

**විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුවේ.**

(අ) **ස්ථාවර වත්කම්**

(ආ) **ඉන්වෙන්ට්‍රි**

(ඇ) **ණයගැති හා ණයහිමි**

(ඈ) **කොන්ත්‍රාත්**

(ඉ) **මූල්‍ය පාලනය**